කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E 1015

පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්ෂරතාව හා තොරතුරු කුසලතා

<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. පුස්තකාල හා විඥාපන විද්‍යාව යනු කුමක්ද? එම විෂයයෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. ''ඕනෑම වෘත්තියක සංවර්ධනය රඳා පවත්නේ අදාළ වෘත්තිකයන්ගේ කැපවීම මත ය.'' පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තිය ඇසුරින් ඉහත සඳහන් මතය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ගවේෂණයේ දී

    i. පුස්තකාල සූචි
    ii. ග්‍රන්ථ නාමාවලී
    iii. අනුක්‍රමණිකා සහ
    iv. සාර සංග්‍රහවලින් ඉටුවන මෙහෙය සැකෙවින් ප්‍රමාණ කරන්න. (ලකුණු 20)

04. ආරම්භයේ සිට වර්තමාන යුගය දක්වා පොතෙහි විකාසය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. ''අන්තර්ජාලයේ සංවර්ධනය හා ව්‍යාප්තිය නිසා මෙතෙක් පුස්තකාල සතුව තිබූ ඒකාධිකාරය බිඳ වැටී තිබේ.'' සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු උද්ධරණය කොට දැක්වීම යනු කුමක් ද? ඔබ හඳාරා ඇති උද්ධරණ ක්‍රමයක් ඇසුරින් සංක්ෂිප්ත උද්ධරණ රටාව හා උද්ධරණය කරනු ලබන ප්‍රකාශනවලට අදාළ ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කරන අයුරු නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. අන්තර්ජාලීය තොරතුරු ගවේෂණයේ දී භාවිත කරනු ලබන ගවේෂණ යන්ත්‍ර (search engines) යනු කවරේද? ඔබ දන්නා එබඳු එක් ගවේෂණ යන්ත්‍රයක් නම් කොට එහි විශේෂ ලක්ෂණ හා හැකියාවන් විස්තර කරන්න. (ලකුණු 20)

***************************